මගේ අංකය: JSC/SEC/CIR – L/2024

**අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ ලිපි අංක: 08/2024**

**සියලුම කලාප මහාධිකරණ විනිශ්චයකාරවරුන් ඇතුළු දෙපාර්තමේන්තු ප්‍රධානීන් ලෙස කටයුතු කරන ලබන අනෙකුත් මහාධිකරණ විනිශ්චයකාරවරුන්, සිවිල් අභියාචන මහාධිකරණ විනිශ්චයකාරවරුන්, දිසා විනිශ්චයකාරවරුන්, මහේස්ත්‍රාත්වරුන් හා සියලුම කම්කරු විනිශ්චයාධිකාර සභාපතිවරුන් වෙත.**

**<u>2023 අංක 09 දරන දූෂණ විරෝධී පනතට අනුව වත්කම් සහ බැරකම් ප්‍රකාශ කිරීම.</u>**

ශීර්ෂගත කරුණට අදාළව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් ඩබ්.කේ.ඩී. විජේරත්න මහතා විසින් අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම් අමතන ලද 2024.03.14 දිනැති ලිපිය (ලිපියේ පිටපතක් මීට අමුණා ඇත) පිළිබඳව සලකා බැලූ අධිකරණ සේවා කොමිෂන් සභාව, එම ලිපියේ 04 වන ඡේදය මගින් ඉල්ලා ඇති පරිදි, ඔබගේ හා ඔබ අධිකරණයේ සේවයේ නියුතු සියලු උපලේඛනගත රජයේ නිලධරයන්ගේ තොරතුරු පහත සඳහන් පරිදි ඉදිරිපත් කිරීමට කටයුතු කල යුතු බව අධිකරණ සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි මෙයින් ඔබට දන්වමි.

(i). පහත සඳහන් ආකෘතිය ප්‍රකාරව ඔබගේ හා ඔබ අධිකරණයේ සේවයේ නියුතු සියලු උපලේඛනගත රජයේ නිලධරයන්ගේ තොරතුරු 2024.05.31 දිනට පෙර අදාළ කලාප මහාධිකරණ විනිශ්චයකාරවරයා (Judge of the High Court of the Zonal High Court) වෙත MS Excel මෘදුකාංගය භාවිතා කර ඉංග්‍රීසි භාෂාවෙන් ඊමේල් හරහා ඉදිරිපත් කිරීමට දෙපාර්තමේන්තු ප්‍රධානීන් ලෙස කටයුතු කරන සියලුම මහාධිකරණ විනිශ්චයකාරවරුන්, සිවිල් අභියාචන මහාධිකරණ විනිශ්චයකාරවරුන්, දිසා විනිශ්චයකාරවරුන්, මහේස්ත්‍රාත්වරුන් හා සියලුම කම්කරු විනිශ්චයාධිකාර සභාපතිවරුන් කටයුතු කල යුතුය.

| Serial No. | Full Name | Designation | Institution (Name of the Court) | NIC No. | TIN | Mobile No. | Email |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

(ii). කලාප මහාධිකරණ විනිශ්චයකාරවරයා විසින් ඉහත අංක (i) පරිදි රැස් කරගත් තොරතුරු සහ එම මහාධිකරණ විනිශ්චයකාරවරයාද තමන් යටතේ සේවය කරනු ලබන සියලු උපලේඛනගත රජයේ නිලධරයන්ගේ තොරතුරුද සමග MS Excel මෘදුකාංගයම භාවිතා කරමින් එක් ගොනුවක් ලෙසට සකසා 2024.06.10 දිනට පෙර "info@jsc.gov.lk" යන අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ ඊමේල් ලිපිනය වෙත යොමු කිරීමට කටයුතු කල යුතුය.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ අණ පරිදි,

එච් .එස්. සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12.

2024 අප්‍රේල් මස 30 වෙනි දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ දීය.

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව
இலஞ்சம் அல்லது ஊழல் பற்றிய சாத்துதல்களைப் புலனாய்வு செய்வதற்கான ஆணைக்குழு
COMMISSION TO INVESTIGATE ALLEGATIONS OF BRIBERY OR CORRUPTION
තැ.පෙ. 1431, 36, මලලසේකර මාවත, කොළඹ 7. ● த.பெ.1431, 36, மலலசேகர மாவத்தை, கொழும்பு 7.● P. O. Box 1431, 36, Malalasekera Mowatha, Colombo 7.
දුරකථන අංක / தொலைபேசி / Telephone: 2559923, 2596360 ෆැක්ස් / தொலைநகல் / Fax: 2596014


මගේ අංකය: BC/Assets/01/2024
2024.03.14

ලේකම්,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය,
තැ.පෙ. 573, අළුත් කඩේ,
කොළඹ 12.

JUDICIAL SERVICE COMMISSION SECRETARIAT
COLOMBO 12
21 MAR 2024

**<u>2023 අංක 09 දරන දූෂණ විරෝධී පනතට අනුව වත්කම් සහ බැරකම් ප්‍රකාශ කිරීම</u>**

2023 අංක 09 දරන දූෂණ විරෝධී පනතේ 80 වන වගන්තිය මගින් නිලධාරී/පුද්ගල කාණ්ඩ ගණනාවක් විසින් වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ අවශ්‍යතාවය දක්වා ඇත.

02. ඒ අනුව, වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීම පිළිබඳ ක්‍රමවේදය ඇතුළත් චක්‍රලේඛය, වත්කම් හා බැරකම් ප්‍රකාශය (ඇමුණුම I), වත්කම් හා බැරකම් ප්‍රකාශ භාර ගත යුතු තැනැත්තන් සඳහන් ලේඛනය (ඇමුණුම II), වත්කම් හා බැරකම් ප්‍රකාශ ලබා දීමට බැඳී සිටින අවස්ථාවන් ඇතුළත් ලේඛනය (ඇමුණුම III) මේ සමඟ ඉදිරිපත් කරමි. එම චක්‍රලේඛය සහ අදාළ ඇමුණුම් භාෂා ත්‍රිත්වයෙන් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ වෙබ් අඩවිය (www.ciaboc.gov.lk) මගින් ද බාගත කර ගත හැක.

03. මින් ඉදිරියට, නැවත දැනුම් දෙන තෙක් ඉහත කී චක්‍රලේඛය ප්‍රකාරව අදාළ නිලධාරීන්/ පුද්ගලයන් විසින් වත්කම් හා බැරකම් ප්‍රකාශන ඉදිරිපත් කළ යුතුය. එසේ ප්‍රකාශ කළ යුතු නිලධාරීන්/ පුද්ගලයන් ව මේ සම්බන්ධයෙන් දැනුවත් කිරීමට කටයුතු කරන මෙන් ඉල්ලා සිටිමි.

04. ඊට අමතරව, 2024.03.31 දිනට වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කළ යුතු නිලධාරීන්ගේ පහත විස්තර ඇතුළත් ලේඛනයක් 2024.04.30 දිනට ප්‍රථම අප වෙත එවීමට කටයුතු කරන මෙන් ඉල්ලා සිටිමි. එම ආකෘතිය පහත පරිදි MS Excel මගින් ඉංග්‍රීසි භාෂාවෙන් assets@ciaboc.gov.lk ඊමේල් ලිපිනය වෙත යොමු කිරීමට කාරුණික වන්න.

| Serial No | Full Name | Institution | NIC | TIN | Mobile Number | Email |
|---|---|---|---|---|---|---|
| | | | | | | |

05. මේ සම්බන්ධයෙන් ඔබතුමන් දක්වන සහයෝගය අගය කොට සලකමි.

ඩබ්.කේ.ඩී.විජේරත්න
අධ්‍යක්ෂ ජනරාල්